**ශීර්ෂය 253 - විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශිර්ෂය 253 - විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජූලි 29 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

-------

### 2.1 විසර්ජන ගිණුම

-----------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

----------------------------

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 187,619.35 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 180,286.55 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 7,332.80 ක් හෙවත් සියයට 3.91 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 187,567.48 | 180,234.87 | 7,332.61 | 3.91 |
| මූලධන | 51.87 | 51.68 | 0.19 | 0.37 |
| **එකතුව** | **187,619.35** | **180,286.55** | **7,332.80** | **3.91** |

## 2.2 ආදායම් ගිණුම්

### ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම්

දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂය සඳහා ආදායම් සංකේත 2 ක් සඳහා එකතුව රු.මිලියන 15,800.00 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 15,213.30 ක ආදායම් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 96.29 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉක්මවීම / (ඌනතාවය) ඇස්තමේන්තුගත ආදායමේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඉක්මවීම/ (ඌනතාවය) | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 20.04.01.00 | 9 800.00 | 10 049.80 | 249.80 | 2.55 |
| 20.04.02.00 | 6 000.00 | 5 163.50 | (836.50) | (13.94) |
| එකතුව | **15,800.00** | **15,213.30** | **(586.70)** | **3.71** |

## 2.3 අත්තිකාරම් ගිණුම

### 2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

#### පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 25301 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 38.88 | 33.38 | 21.88 | 26.10 | 130.00 | 104.63 |

## 2.4 අග්‍රිම ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වූ අංක 7002/0000/00/0062/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. මිලියන 459.46 ක් විය.

**2.5 පොදු තැන්පත් ගිණුම්**

දෙපාර්තමේන්තුව යටතේ වන පොදු තැන්පත් ගිණුම් 4 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු. මිලියන 6.86 ක් විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | **රු. මිලියන** |
| 6000/0000/00/0015/0133/000 | 0.07 |
| 6000/0000/00/0001/0114/000 | 0.31 |
| 6000/0000/00/0013/0113/000 | 3.88 |
| 6000/0000/00/0016/0103/000 | 2.60 |
| **එකතුව** | **6.86** |

**2.6 විගණන නිරීක්ෂණය**

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | **ලේඛන වර්ගය** | **අදාල රෙගුලාසිය** |
|---|---|---|
| (i) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ii) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (iii) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) |
| (iv) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 |
| (v) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) |

## 3.2 විගණන සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී මියගිය හා ආබාධිත වූ රණවිරුවන් සඳහා අවුරුදු 55 දක්වා වැටුප් හා දීමනා ගෙවීම සඳහා සන්නද්ධ අංශයන් හා පොලිසීය වෙත රු.මිලියන 23,432.65 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. එම ගෙවීම්වලට අදාළව වියදම් වාර්තා සහ ප්‍රතිලාභීන් සංඛ්‍යාවන්ගේ වෙනස් වීම් හා ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අංක හෝ වැන්දඹු අනත්දරු අංක, ජාතික හැඳුනුම්පත් අංක, යැපෙන්නන් පිළිබඳ විස්තර, අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යනාදි සාක්ෂි විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් විගණනය වෙත ඉදිරිපත් නොකිරීම නිසා ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සංනිරික්ෂණය කිරිමට නොහැකි විය.

(ආ) සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 16,967.71ක් විශ්‍රාම වැටුප් ගෙවීම් වැය විෂයයට අධිභාර කර තිබුණි. එම අධිභාර කළ ගෙවීම්වලට අදාළ තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. මේ නිසා විශ්‍රාම වැටුප් ගෙවීම සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරිමට නොහැකි විය.

(ඇ) ජංගම නොවන සංචලන වාර්තාවේ සඳහන් 2015 ජනවාරි 01 දිනට වූ රු.මිලියන 218.94 ක් හා 2015 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 1,988.60 ක් වූ ස්ථාවර වත්කම්වල වටිනාකම හා භෞතික ප්‍රමාණය පරීක්ෂා කිරීමට ස්ථාවර වත්කම් ලේඛනය විගණනය වෙත ඉදිරිපත්කර නොතිබුණි.

(ඈ) බැංකු ණය මඟින් පාරිතෝෂික ගෙවීම සම්බන්ධ කරමින් පාලන ගිණුමක් පවත්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. බැංකුව විසින් ඉදිරිපත් කරන ලද රු.මිලියන 19,417.78 ක ණය ශේෂයේ නිවැරදිතාවය තහවුරු කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඉ) මධ්‍යගතව දෙපාර්තමේන්තුව තුළ පවත්වාගෙන යනු ලබන විදේශ විශ්‍රාම වැටුප් ලේඛනාගාරයේ ලිපිගොනු අතරින් කැනඩාවේ පදිංචි විශ්‍රාමිකයන් 2773 දෙනෙකුගෙන් 762 දෙනෙකුගේ නියැදියක් පරීක්ෂා කරන ලදී. එහිදී විශ්‍රාමිකයා හා විශ්‍රාමික ලිපි ගොනුව අතර ද විශ්‍රාමික ලිපිගොනු හා විදේශ විශ්‍රාම වැටුප් ගෙවීම් දත්ත පද්ධතිය අතරද සම්බන්ධයක් පවත්වා නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේදී ගෙවන ලද රු.මිලියන 1,841.77 ක් වූ විදේශ විශ්‍රාම වැටුප් ගෙවීම සතුටුදායක ලෙස සංනිරික්ෂණය කිරිම ප්‍රමාණවත් සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඊ) 2015 වර්ෂයේ විසර්ජන ගිණුමේ හානි හා පාඩු යටතේ රු.මිලියන 208.85 ක විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවා තිබුණු බව සඳහන් කර තිබුණි. ඒ පිළිබඳව ඉදිරිපත් කර තිබුණු උපලේඛනය අසම්පූර්ණ ලෙස පිළියෙල කර තිබුණි. මේ නිසා එසේ වැඩිපුර ගෙවීම්වල නිවැරදිතාවය තහවුරු කර ගැනිමට නොහැකි විය.

## 3.3 විගණන විමසුම්වලට පිළිතුරු දීම

දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී නිකුත් කරන ලද විගණන විමසුම් 03 කට සහ ඉකුත් වර්ෂවලදී නිකුත් කළ විගණන විමසුම් 02 කට 2016 මාර්තු 31 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු. මිලියන 16,330 ක් වී තිබුණි.

## 3.4 අධිවැය

--------

පහත සඳහන් වැය විෂයයන් දෙකක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන ඉක්මවා උපයෝජනයන් කිරීම නිසා එකතුව රු.මිලියන 3,786.86 ක අධිවැය නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| වැය විෂය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | අධිවැය |
|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 253-1-2-2-1502(21) | 35,200.00 | 38,964.54 | 3,764.54 |
| 253-1-2-3-1502 | 28.06 | 50.38 | 22.32 |
| **එකතුව** | **35,228.06** | **39,014.92** | **3,786.86** |

## 3.5 විසර්ජන ගිණුම

-----------------

### 3.5.1 අයවැය විචලනය

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 07 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 5.6 ක සිට සියයට 22.37 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ආ) 2015 අප්‍රේල් 09 දින සිට විශ්‍රාම පාරිතෝෂිකය බැංකු ණය යටතේ ගෙවීම් සිදු කළද 253-1-2-1502 (11) වැය විෂයය යටතේද රු.මිලියන 18,000 ක ප්‍රතිපාදනයක් සලසා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී එම වැය විෂයය යටතේ රු.මිලියන 5,418 ක් හෙවත් සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 30 ක් පමණක් වැය කර තිබුණි. විශ්‍රාම පාරිතෝෂික ගෙවීම සඳහා ප්‍රතිපාදිත මුදල් උපයෝජනය නොකර 2015 වර්ෂයේදී රු.මිලියන 9,710.87 ක් බැංකු ණය ලබාගෙන තිබීම නිසා වැය විෂයයෙහි රු. මිලියන 12,582 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

### 3.5.2. ගිණුම් තැබීම

-------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විශ්‍රාම පාරිතෝෂික බැංකු ණය පහසුකම් යටතේ විශ්‍රාමිකයින්ට ගෙවා තිබුණි. එම ණය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 1,584.28 ක ණය පොලී ගෙවා තිබුණි. එම පොලී ගෙවීම 1601 වැය විෂය යටතේ වන ණය පොලී යටතේ ගිණුම්ගත නොකර 1502 වැය විෂය යටතේ විශ්‍රාමික ප්‍රතිලාභ ගෙවීම යටතේ ගිණුම්ගත කර තිබුණි. මේ නිසා ජනරජයේ මූල්‍ය ප්‍රකාශනවල ණය පොලී වියදම රු.මිලියන 1,584.28 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) විශ්‍රාමික සංගණනයක් සිදුකර මධ්‍යගත දත්ත පද්ධතියේ නිවැරදිතාවය තහවුරු කර ගෙන ගෙවීම් කටයුතු සිදු කර නොතිබුණි.

(ඇ) 2015 වර්ෂයේදී විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත රු.මිලියන 437.54 ක් ගෙවා තිබුණි. භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව එම වියදම රු.මිලියන 413.76 ක් වී තිබුණි. ඒ අනුව රු.මිලියන 23.78 ක වෙනස අනාවරණය කර ගෙන නොතිබුණි.

(ඇ) විශ්‍රාමිකයාට ගෙවනු ලැබූ මුළු පාරිතෝෂික මුදල අයවීමට පෙර මියයන විශ්‍රාමිකයාගෙන් අය නොවන කොටස රජයට පාඩුවක් වුවත්, එය ගිණුම්වලින් අනාවරණය කර නොතිබුණි.

## 3.6 අග්‍රිම ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු. මිලියන 21,872 ක් වූ අනෙකුත් ආදායම් පිළිබඳ සැලකිල්ලකින් තොරව සමාලෝචිත වර්ෂයේ අග්‍රිම සීමාව ගණනය කර තිබුණද එම අග්‍රිම සීමාව ඉක්මවා රු. මිලියන 21,968.52 ක වැඩිපුර අග්‍රිම ඉල්ලීම් කර තිබුණි.

(ආ) තත්කාර්ය අතුරු අග්‍රිම අදාළ කාර්ය සඳහා ඇස්තමේන්තුවක් මත නිකුත් නොකිරීම නිසා අවස්ථා 13 කදී නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිමවලින් එකතුව රු.230,000 ක් අදාළ කාර්යයට උපයෝජනය නොකර ආපසු මුදලින් පියවා තිබුණි.

(ඇ) මාසික විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට 2015 ජනවාරි මාසය සඳහා රු. මිලියන 47.27 ක් වැඩිපුර ලබා දී තිබුණි. මේ හේතුවෙන් 2015 ජනවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා රු.මිලියන 47.27 ක් නිෂ්කාර්යව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පැවැතුණි.

## 3.7 ආදායම් ගිණුම්

දෙපාර්තමේන්තු ප්‍රධානියට, ආදායම් ගණන්දීමේ නිලධාරියා වශයෙන් ආදායම් සංකේත 02 ක ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආදායම් රැස්කිරීම, ගිණුම්ගත කිරීම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්යභාරයන් පැවරී තිබුණි. එම ආදායම් සංකේතවලට අදාළව සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) 20.04.01.00 දරන ආදායම් සංකේතය - සමාජ සංරක්ෂණ දායක මුදල් (මධ්‍යම රජය)**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව ආදායම් සංකේතයට ආදාළව රු. මිලියන 9,800 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.මිලියන 10,050 ක ආදායම් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 102.5 ක් වී තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 12.94 ක ආදායම් ආපසු ගෙවා තිබුණත්, එහි නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(iii) මධ්‍යම රජයට අයත් ආයතනයන්ගෙන් සමාලෝචිත වර්ෂයේදී සමාජ සංරක්ෂණ දායක මුදල් ලෙස එකතුව රු.මිලියන 10,049.80 ක් ලැබී තිබුණි. මාසිකව ලැබුණු සමාජ සංරක්ෂණ දායක මුදල් පසුගිය මාස සමඟ සැසඳීමේ විචලනය රු.මිලියන 88.68 ක් වූ සෘණ අගයක සිට රු.මිලියන 223.19 ක් වූ ධන අගයක් දක්වා පරාසයක ප්‍රමාණයකින් විචලනයන් සිදු වී තිබුණි. එම විචලනයන්ට හේතු පැහැදිලි කර නොතිබුණි.

(iv) මධ්‍යම රජයේ ආදායම් ගිණුමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු ශීර්ෂය යටතේ මාසිකව ලැබුණු සමාජ සංරක්ෂණ දායක මුදල් ලැබීම් රු.5,476,189 සිට රු.46,793,765 ක් දක්වා පරාසයක අගයක් ගෙන තිබුණි. ඒ පිළිබඳව සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී මධ්‍යම රජයේ සමාජ සංරක්ෂණ දායක මුදල් ලැබීම් රු.මිලියන 35.97 ක් වැඩියෙන්ද, පළාත් සභා සමාජ සංරක්ෂණ දායක මුදල් ලැබීම් රු.මිලියන 35.97 ක් අඩුවෙන්ද ගිණුම්වල දක්වා තිබුණි.

(v) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අදාළව 2007 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා නිලධාරීන් 36 දෙනෙකු වැටුප් රහිත නිවාඩු ලබා සිටි කාලය සඳහා දායක මුදල් ගෙවා නොතිබුණි. එසේ වුවද 2014 හා 2015 වර්ෂවල ආදායම් ගිණුම්වල උපලේඛන සහිතව නිරීක්ෂණ ඉදිරිපත් කර තිබුණද, 2016 අප්‍රේල් 30 දින වන විටත් ඒ සම්බන්ධව පසු විපරම් කටයුතු සිදු කර නොතිබුණි.

**(ආ) 20.04.02.00 දරන ආදායම් සංකේතය - සමාජ සංරක්ෂණ දායක මුදල් (පළාත් සභා)**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i) දායක මුදල් රැස්කිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- සමාජ සංරක්ෂණ ක්‍රමය යටතේ ලියාපදිංචි වූ රාජ්‍ය නිලධාරීන් පිළිබඳ දත්ත පද්ධතියක් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් පවත්වා නොතිබුණි.

- සමාජ සංරක්ෂණ දායක මුදල් ක්‍රමය යටතේ වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් සහ දායක මුදල් ආපසු ගෙවීමේදී ඒ ඒ පුද්ගලයාගෙන් නිශ්චිතව අඛණ්ඩව එම දායක මුදල් ලබා ගෙන තිබුණු බව සනාථ කර ගැනීමට නිසි ක්‍රමවේදයක් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සතුව නොතිබුණි.

- ආදායම් ගිණුම සඳහා මාසිකව විවිධ ආයතනවලින් චෙක්පත් 630 ක් පමණ ලැබී තිබුණි. සෑම මාසයකයදීම අදාළ ආයතනවලින් නියමිත දායක මුදල නිවැරදිව අදාළ දිනට ලැබුණු බව හා හිඟහිට ඇත්නම් ඒ බව හෙළිදරව් වන ආකාරයෙන් අභ්‍යන්තර පරීක්ෂාවක් සිදුවන පරිදි ලැබීම් ශීර්ෂ අනුව වර්ග කර ලේඛනයක් පවත්වා නොතිබුණි. එමෙන්ම මුදල් රෙගුලාසි 128 (2) (උ) සහ 2015 ජුලි 20 දිනැති අංක 1/2015 දරන රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව එකතු කරන ලද ආදායම් පිළිබඳ වාර්තා දෙපාර්තමේන්තුව විසින් ප්‍රමාණවත් අයුරින් හා ක්‍රමවත්ව පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි.

- සමාජ සංරක්ෂක දායක ක්‍රමය යටතේ ලියාපදිංචි කර අංකයක් ලබා දීමකින් තොරව, දැනට රාජ්‍ය සේවයේ සිටින නිලධාරීන්ගෙන් දායක මුදල් රැස් කරන අවස්ථා මෙන්ම, දැනට විශ්‍රාම ගිය නිලධාරීන් දායක මුදල් ගෙවා ලියාපදිංචි අංකයක් ලබාදී නොතිබුණු අවස්ථාද තිබුණි. ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය සභා සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී ප්‍රාදේශිය සභා 04 ක සේවකයින් 280 කට වැන්දඹු අනත්දරු අංක ලබාදීමකින් තොරව දායක මුදල් රැස්කර තිබුණි.

- ප්‍රතිව්‍යුහගත කිරීමේදී අංක ලබාදීම පිළිබඳව නිකුත් කර තිබූ කිසිදු චක්‍රලේඛයක වැන්දඹු හා අනත්දරු දායක ක්‍රමය යටතේ ලියාපදිංචි අංකයක් ලබා දී නොතිබුණු විශ්‍රාමිකයින් සඳහා අංක ලබාදීමට වැඩ පිළිවෙලක් ස්ථාපිත කර නොතිබුණි.

**(ii)** **හිඟ ආදායම්**

**-------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- දායක මුදල් ලැබීම පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබීම නිසා පළාත් සභා 7 ක් විසින් ඉදිරිපත් කරන ලද රු.මිලියන 285.98 ක් වූ හිඟ ආදායමේ නිවැරදිතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය. එම ආයතන විසින් වාර්තාකර තිබුණු මුළු වටිනාකම හිඟ ආදායම් ලෙස ගිණුම් ගත කර තිබුණි.

- ආදායම් ගිණුම් පිළියෙල කිරීමේදී බස්නාහිර හා මධ්‍යම පළාත් සභාවල ආයතනයන්ට අදාළ වූ හිඟ ආදායම්, සැලකිල්ලට ගෙන නොතිබුණි.

- පළාත් සභාවලින් සමාජ සංරක්ෂණ දායක මුදල් ලෙස දෙපාර්තමේන්තුවට ලැබෙන මුදල මාසිකව විවිධ අගයන් ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයේදි සමාජ සංරක්ෂණ දායක මුදල් ලෙස ලැබුණු මුදල රු.මිලියන 5,163.76 ක් වි තිබුණි. එම ලැබීම්වල මාසික විචලනය රු.මිලියන 287.13 ක් වූ සෘණ අගයක සිට රු.මිලියන 138.41 ක් වූ ධන අගයක් දක්වා පරාසයක් ගෙන තිබුණි.

- සමාලෝචිත වර්ෂයේදී ආදායම් ලෙස ලැබී තිබුණු නමුත් චෙක්පත් විකෘති වීම් හා කල් ඉකුත් වීම් වැනි විවිධ හේතූන් නිසා ගිණුම් තැබීමෙන් තොරව අදාළ ආයතන වෙත ආපසු හරවා යැවූ එකතුව රු.මිලියන 3.90 ක් වූ චෙක්පත් 33 ක මුදල, හිඟ ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

**(iii)** **දායක මුදල් ආපසු ගෙවීම**

**-------------------------**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- මුදල් රෙගුලාසි 118(2)(ආ) ප්‍රකාරව ආදායම් ආපසු ගෙවීමේ අවස්ථා සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී රු. 604,324 ක් වූ සමාජ සංරක්ෂණ දායක මුදල් ආදායමෙන් ආපසු ගෙවීම් සඳහා අදාළ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

- දායක මුදල් ගෙවීම විමධ්‍යගත කිරීම යටතේ 2015 වර්ෂයේදී විශ්‍රාමිකයින් 526 දෙනෙකුට එකතුව රු.මිලියන 23.98 ක් ආපසු ගෙවා තිබුණි. මුදල් රෙගුලාසි 205 ප්‍රකාරව ආපසු ගෙවීම දෙවරක් සිදුවීම වළක්වා ගැනීම සඳහා ඒ ඒ ආයතනික මට්ටමෙන් ගෙවීම් පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි.

- මධ්‍යම රජයේ හා පළාත් සභාවල සේවයේ නියුතු ද්විතික පදනම මත මුදාහරින ලද නිලධාරින්ගේ දායක මුදල් ලැබීම් සම්බන්ධ ලේඛන පවත්වා නොතිබුණි.

## 3.8 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 25301 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 2,422,351 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 24 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

## 3.9 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 3.9.1 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙළ කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරි සැලැස්ම ලෙස, ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් විය යුතු උප සැලැස්මක් පමණක් පිළියෙල කර තිබුණි..

(ආ) ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ සැලැස්ම වාර්ෂික අයවැය පදනම් කර ගෙන ප්‍රමුඛතා අනුව හා එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමවුම/ ප්‍රතිඵල පැහැදිලිව හඳුනා ගැනිමට හැකි වන පරිදි පිළියෙල කර නොතිබුණි.

(ඇ) විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ගෙවීම දෙපාර්තමේන්තුවේ ප්‍රධානතම මෙහෙයුම් කටයුත්ත වුවද, විශ්‍රාමික නිලධාරියෙකුගේ ප්‍රතිලාභ හිමිකම් යටතේ අදාළ අංශයන් වෙත ප්‍රතිලාභ අයදුම්පතක් ඉදිරිපත් කිරීමේ සිට ප්‍රතිලාභ ගෙවීම දක්වා වූ ක්‍රියාදාමයේ කාර්යභාරය පිළිබඳව වගකීම පවරමින් ගෙවීම්වල ප්‍රතිඵල ඇගයීමට හැකි පරිදි කාර්යසාධක දර්ශක සකස් කර වාර්ෂිකව ප්‍රගතිය සමාලෝචනය කිරීමක් සිදු කෙරෙන පරිදි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

### 3.9.2 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විශ්‍රාමිකයන්ට අදාල විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ගෙවිමේදි එක් විශ්‍රාමිකයෙකුට රු.මිලියනයකට වැඩි ගෙවිම් සම්බන්ධයෙන් අනුමත කිරීම් ත්‍රිපුද්ගල කමිටුවෙහි එක් සාමාජිකයෙකු ලෙස ප්‍රධාන අභ්‍යන්තර විගණකද පත්කර තිබීම හේතුවෙන් එම ගනුදෙනු සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණකගේ ස්වාධීනත්වය කෙරෙහි බලපා තිබුණි

**(ආ)** සමාලෝචිත වර්ෂයේදී අභ්‍යන්තර විගණන සැලැස්මෙහි ඇතුළත් කර තිබුණු විගණන ක්ෂේත්‍ර ක්‍රියාත්මක කළ යුතුව තිබුණත්, අභ්‍යන්තර විගණන අංශය ඒ කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර නොතිබුණි.

**3.9.3 විගණන හා කළමණාකරණ කමිටුව**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) සමාලෝචිත වර්ෂයේදී විගණන හා කළමණාකරණ කමිටුවේ රැස්වීම් වාර කාර්තුවකට එකක් බැගින් අවම වශයෙන් රැස්වීම් වාර 04 ක් පැවැත්විය යුතු වුවත්, රැස්විම් වාර 02 ක් පමණක් පවත්වා තිබුණි.

(ආ) විගණන හා කළමනාකරණ කමිටුවේදී විගණකාධිපතිවරයා විසින් හා අභ්‍යන්තර විගණන අංශ විසින් දෙපාර්තමේන්තුව වෙත නිකුත් කර තිබුණු විගණන විමසුම් සම්බන්ධයෙන් සාකච්ඡා කර නොතිබුණි.

**3.9.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාවක් පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2016 අගෝස්තු 09 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**3.10 වත්කම් කළමනාකරණය**

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2015 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2016 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, එම වාර්තා 2016 ජූලි 09 දින විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි.

**(ආ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

විදුලි සංදේශ හා තොරතුරු අමාත්‍යාංශය සතු මෝටර් වාහනයක් 2015 ජනවාරි මාසයේ සිට විධිමත් අනුමැතියකින් තොරව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් භාවිතයට ගෙන තිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

**(ඇ) බේරුම් නොකළ බැරකම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු.මිලියන 19,642.15 ක් වී තිබුණි.

(ii) බැරකම් ප්‍රකාශයෙහි ගෙවිය යුතු පාරිතෝෂික ණය වාරික යටතේ රාජ්‍ය බැංකුවට අදාළව ගෙවිය යුතු ණය වාරික වටිනාකම රු. 1,071,351 කින් වැඩියෙන් දක්වා තිබුණි.

## 3.11 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) | මුදල් රෙගුලාසි 41(1) | 32,760,325 | ඩෙක්ස්ටොප් පරිගණක 150 ක්, ලැප්ටොප් පරිගණක 300 ක් සහ ටැබ්ලට් පරිගණක 20 ක් මිලදී ගැනීමේදී අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ පූර්ව අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 103 හා 104 | - | විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඔවුනට එරෙහිව විනය පියවර ගැනීමකින් තොරව, වැඩිපුර ගෙවූ මුදල් විශ්‍රාමිකයාගෙන් අයකර ගැනීමට පමණක් කටයුතු කර තිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 1646 | - | දෙපාර්තමේන්තුව සතු වාහනවලට අදාළ දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා එළඹෙන මාසයේ 15 දිනට පෙර විගණනය වෙත ලබාදී නොතිබුණි. |
| (ආ) | **විශ්‍රාම වැටුප් චක්‍රලේඛ** | | |
| | 2014 අප්‍රේල් 07 දිනැති අංක 1/2011 දරන චක්‍රලේඛය | - | විමධ්‍යගතව හා මධ්‍යගතව විශ්‍රාම වැටුප් ගෙවීම් කිරීමේදී පාලන ගිණුමක් පිළියෙල කර නොතිබුණි. |

(ඇ) **රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය**

**------------------------------**

5.4.4 (i) මාර්ගෝපදේශය - විදුලි ජනක යන්ත්‍රයක් මිලදී ගැනීමේදී හා ගෘහයක් ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 20 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගෙවිය හැකි වුවත්, ඒ සඳහා සියයට 50 ක් වූ රු.මිලියන 1.67 ක අත්තිකාරම් ගෙවා තිබුණි.

**3.12 කාර්යසාධනය**

**---------------**

2014 වර්ෂයේ ප්‍රසම්පාදන සැලසුම අනුව ඩෙක්ස්ටොප් පරිගණක 31 ක් හා ලැප්ටොප් පරිගණක 05 ක් මිලදී ගැනීම සඳහා රු. මිලියන 2.99 ක ප්‍රතිපාදන සලසා තිබුණද, එම සීමාවන් නොසලකා ඩෙක්ස්ටොප් පරිගණක 150 ක්, ලැප්ටොප් පරිගණක 300 ක් සහ ටැබ්ලට් පරිගණක 20 ක් මිලදී ගැනීම සඳහා රු.මිලියන 32.76 ක් වැය කර තිබුණි.

**3.13 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

**-----------------------------------**

**ගැලපුම් කළයුතු ශේෂ**

**-----------------------**

දෙපාර්තමේන්තුවේ බැංකු ගිණුමකට අදාළ 2015 ඔක්තෝබර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව එදින වන විට නිකුත් කර තිබුණු නමුත් බැංකුව වෙත ඉදිරිපත් නොවූ මාස 6 ක කාලයක් ඉකුත් වූ එකතුව රු.510,009 ක් වටිනා චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.14 අවිධිමත් ගනුදෙනු**

**----------------------**

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර කටයුතු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථාවන් පහත දැක්වේ.

(අ) **අධිකාරි බලය නොමැති ගනුදෙනු**

**----------------------------------**

විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2 හා 25 වගන්තිවලට අනුව විශ්‍රාම පාරිතෝෂික ලබාගැනීමට මනාපය පලකර විශ්‍රාම පාරිතෝෂික ලබා ගත් විට මුළු පාරිතෝෂික මුදලින් සියයට 60 ක් පමණ රජයට වාරික වශයෙන් නැවත අය කරනු ලැබේ. කෙසේ නමුත්, විශ්‍රාම පාරිතෝෂික ලබාගැනීමට මනාපය පල කර පාරිතෝෂික ලබාගෙන තිබුණු ශ්‍රේෂ්ඨාධිකරණය සහ අභියාචණාධිකරණයේ විනිසුරුවරුන්ගෙන් එම සියයට 60 ක ප්‍රමාණය නැවත අය කරගෙන නොතිබුණි. නියැදි විගණන පරීක්ෂාවේදී විනිසුරුවරුන් 5 දෙනෙකුගෙන් නැවත අයකර ගත යුතුව තිබුණු පාර්තෝෂික මුදලේ එකතුව රු.මිලියන 13.46 ක පාරිතෝෂික මුදලක් නැවැත අය කරගත යුතුව තිබුණි.

**(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

---

2014 හා 2015 වර්ෂවලදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට පටහැනිව මිල සැසඳුම් ක්‍රමය භාවිතා කර අවස්ථා 07 කදී රු.මිලියන 15.42 ක භාණ්ඩ මිලදී ගෙන තිබුණි.

**3.15 විසඳා නොතිබුණු විගණන ඡේද**

---

දෙපාර්තමේන්තුවට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේද වලින් පෙන්වා දුන් ඌනතාවයන් සඳහා දෙපාර්තමේන්තුව විසින් පසුවිපරම් කටයුතු නොකල ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| **වර්ෂය** | **ඡේද අංකය** | |
| 2013 | 2.7(අ) | ඉ- විශ්‍රාම වැටුප් ව්‍යාපෘතිය සඳහා වැටුප් හා වේතන, පුහුණු වීම් වියදම් හැර රු.මිලියන 182.22 ක් වැය කර තිබුණද, 2013 නොවැම්බර් 01 දින සිට එම ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම නවතා තිබුණි. |

**3.16 කළමනාකරණ දුර්වලතා**

---

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

**(අ) විශ්‍රාම පාරිතෝෂික බැංකු ක්‍රමය මඟින් ගෙවීම.**

---

2014 අප්‍රේල් 09 දින වන විට 2013 හා 2014 වර්ෂවලට අදාළව ගෙවිය යුතු විශ්‍රාම පාරිතෝෂික අයදුම්පත් 17,029 ක් දෙපාර්තමේන්තුව වෙත ලැබී තිබුණි. එම අයදුම්පත් සම්බන්ධයෙන් විධිමත් පරිදි තොරතුරු ලබා ගැනීමෙන් තොරව බැංකු ක්‍රමය උපයෝගී කර ගෙන විශ්‍රාමිකයන් වෙත පාරිතෝෂික එම විශ්‍රාමිකයන්ගේ බැංකු ගිණුම්වලට සෘජුව බැර කර තිබුණි. එසේ නමුත් අයදුම්පත්‍ර 17,029 ක් අතර සිටින පළාත් සභා නිලධාරින්ගෙන් රජයට අයවිය යුතු අවකරණ මුදල් නොසලකා පාරිතෝෂික විශ්‍රාමිකයින් වෙත සම්පූර්ණයෙන්ම ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විශ්‍රාමිකයින් 182 දෙනෙකුට එකතුව රු.මිලියන 9.96 ක විශ්‍රාමික පාරිතෝෂික වැඩිපුර ගෙවා තිබුණි.

(ii) බැංකු ණයක් මගින් පාරිතෝෂික ගෙවන බැවින් වැඩිපුර ගෙවා තිබුණු පාර්තෝෂික සඳහාද සියයට 12 ක අමතර පොලියක් රජය විසින් ගෙවා තිබුණි.

(iii) ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.2.3 වගන්තිය ප්‍රකාරව සමස්ථ වැඩිපුර ගෙවීම් අනාවරණය කර ගැනීමට කඩිනම් පියවර ගෙන නොතිබුණි.

(iv) 2015 වර්ෂයේදී පාරිතෝෂික ගෙවීම සඳහා රු. මිලියන 18,000 ක ප්‍රතිපාදන සලසා තිබුණද, එය වැය නොකර පාරිතෝෂික මුදල් ගෙවීම සඳහා 2014 අප්‍රේල් 09 දින සිට 2015 දෙසැම්බර් 31 දින දක්වා රු.මිලියන 20,402.44 ක ණය මුදලක් රාජ්‍ය බැංකු 3 මගින් ලබාගෙන තිබුණි. ඒ සඳහා පොලී වශයෙන් රු.මිලියන 2,209.06 ක් ගෙවා

තිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන විට මුළු ණය ශේෂය රු.මිලියන 19,289.29 ක් වී තිබුණි.

(v) ප්‍රථම විශ්‍රාම වැටුප ගෙවීම හා ණය යටතේ පාරිතෝෂික ගෙවීම පදනම් කර ගනිමින් පාලන ගිණුමක් පවත්වා නොතිබුණි.

(vi) මධ්‍යම රජයට අයත් නිලධාරීන්ගෙන් රජයට අයවිය යුතු අවකරණ වියදම විශ්‍රාම පාරිතෝෂික ගෙවන අවස්ථාවේදීම ගිණුම් මගින් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) යුද්ධයේදී මියගිය හා අබාධිත වූ රණවිරුවන් සඳහා ජීවන වියදම් දීමනාව වැඩිපුර ගෙවීම.**

---

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) යුද්ධයේදී මියගිය හා අබාධිත වූ රණවිරුවන් වෙනුවෙන් අවුරුදු 55 දක්වා වැටුප් හා ජීවන වියදම් ඇතුළු දීමනාවද, ඊට අමතරව විශ්‍රාම වැටුප හෝ වැන්දඹු විශ්‍රාම වැටුප සමඟ නැවතත් ජීවන වියදම් දීමනාවද ගෙවීම හේතුවෙන් ජීවන වියදම් දීමනා දෙවරක් ගෙවා තිබුණි. නාවික හා ගුවන් හමුදා නිලධාරීන් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවට අනුව 2008 වර්ෂයේ සිට 2015 සැප්තැම්බර් මාසය දක්වා යුද්ධයේදී මියගිය හා ආබාධිත වූ රණවිරුවන් 337 දෙනෙකුට රු.මිලියන 22.05 ක මුදලක් ජීවන වියදම් දීමනාව ලෙස වැඩිපුර ගෙවා තිබුණි.

(ii) විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය 2008 වර්ෂයේ සිට පෙන්නුම් කරන බැවින් ඊට පෙර සිදු කරන ලද එවැනි සියළු වැඩිපුර ගෙවීම් විශ්‍රාමික ලිපිගොනු පරීක්ෂා කිරීම තුළින් අනාවරණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) 2008 පෙබරවාරි 06 දිනැති අංක 06/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධානයන්ට පටහැනිව සන්නද්ධ අංශයන් හා පොලිසියේ නිලධාරීන්ට විශ්‍රාම වැටුප සමඟ වැඩිපුර ගෙවනු ලබන ජීවන වියදම් දීමනාව අත්හිටුවීමට පියවර ගෙන නොතිබුණි.

(iv) ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විශ්‍රාම වැටුප් ගෙවීම පිළිබඳව සිදුකළ අභ්‍යන්තර විගණන අංශය විසින් මීට වර්ෂ 10 කට පෙර සිටම ජීවන වියදම් දීමනා වැඩිපුර ගෙවීම අනාවරණය කරගෙන තිබුණත්, එය නිවැරදි කිරීමට ප්‍රමාණවත් පරිදි ක්‍රියාකර නොතිබුණි.

**(ඇ) විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම්**

---

2014 වර්ෂයේ සිට ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් විශ්‍රාම වැටුප් ගෙවීමේදී, විශ්‍රාමිකයන් වෙත විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම්, ද්විත්ව ගෙවීම්, වංචා සහගත ගෙවීම් කර තිබුණු බව නිරීක්ෂණය විය. එම වැරදි සහිත ගෙවීම් වළකා ගැනීමේ අරමුණ මත පදනම්ව විශ්‍රාම වැටුප් ගෙවීම ප්‍රතිව්‍යුහගත කිරීම් යටතේ, 2014 ජූනි මාසයේ සිට හිඟ විශ්‍රාම වැටුප් ගෙවීමද, 2014 ඔක්තෝබර් මාසයේ සිට ප්‍රථම විශ්‍රාම වැටුප් ගෙවීමද, 2015 ජනවාරි මාසයේ සිට මධ්‍යගත දත්ත පද්ධතිය ආරම්භ කර, විශ්‍රාම වැටුප් ගෙවීමද, 2015 සැප්තැම්බර් මාසයේ සිට වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීමද දෙපාර්තමේන්තුව මගින් ආරම්භ කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂනයන් කරනු ලැබේ.

(i) 2015 ජනවාරි මාසයේ සිට 2015 දෙසැම්බර් මාසය අවසාන වන විටත් විශ්‍රාමිකයින් 31 දෙනෙකුට දෙවරක් බැගින් රු.මිලියන 5.55 ක විශ්‍රාම වැටුප්ද, විශ්‍රාමිකයින් 134

දෙනෙකුට දෙවරක් බැගින් රු.මිලියන 19.19 ක් හිඟ විශ්‍රාම වැටුප්ද, වැඩිපුර ගෙවා තිබුණි.

(ii) මූලික වැටුප සමඟ ගෙවනු ලබන අන්තර් දීමනා, ජීවන වියදම් දීමනා ආදිය 2015/2016 වර්ෂ වලදී නියමිත ප්‍රමාණයට වඩා රු. මිලියන 105.67 ක් වැඩි පුර ගෙවා තිබුණි.

(iii) ප්‍රතිව්‍යුහගත කිරීම තුළින් මධ්‍යගතව විශ්‍රාම වැටුප් ගෙවීමේදී ශක්තිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් ඇති නොකිරීම විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම සඳහා හේතු වී තිබුණි. එවැනි හඳුනාගත් හේතූන් සහ අවදානම් තත්ත්වයන් කිහිපයක් පහත දැක්වේ.

- විශ්‍රාම වැටුප් ගෙවීම් ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ ශක්‍යතා අධ්‍යනයක් සිදුකර නොතිබුණි.
- විමධ්‍යගත කිරීම තුළ සිදු වී තිබුණු සියළු වැඩිපුර ගෙවීම් හා වංචාවන් හඳුනාගෙන රජයට සිදුවන පාඩුව අවම කර ගැනිමට විශේෂ වැඩ පිළිවෙලක් ස්ථාපිත කර නොතිබුණි.
- මධ්‍යගතව විශ්‍රාම වැටුප් ගෙවීම පිළිබඳ, නිසි සැලසුම් කිරීමකින් තොරව විශ්‍රාම වැටුප් චක්‍රලේඛ මඟින් පමණක් ප්‍රතිව්‍යුහගත කිරීම සිදු කර තිබුණි.
- ප්‍රථම විශ්‍රාම වැටුප, මූලික නෛතික ලියවිල්ල වන විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රය නිකුත් කිරිමට පෙර ගෙවීමට ආරම්භ කර තිබුණද, රාජ්‍ය නිලධාරින් පිළිබඳ යාවත්කාලින වූ දත්ත පද්ධතියක් නොතිබීමෙන් විශ්‍රාමික අයදුම්පත තහවුරු කරගැනිමට ක්‍රමවේදයක් නොතිබුණි.\
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් පවත්වාගෙන තිබු විශ්‍රාමිකයින් පිළිබඳ දත්ත සමුදායන්හි (database) බොහෝ අඩුපාඩු පැවතියද එය නොසලකා එම දත්ත සමුදායන් (database) ඒකරාශී කොට මධ්‍යම දත්ත පද්ධතිය නිර්මාණය කර තිබුණත්, පැවති දුර්වලතාවයන්ද නව මධ්‍යගත පරිගණක දත්ත පද්ධතිය තුළද පැවැතුණි.
- විශ්‍රාමික සංගණනයක් සිදුකර මධ්‍යගත දත්ත පද්ධතියේ නිවැරදිතාවය තහවුරු කර ගනිමින් විශ්‍රාමිකයා හා විශ්‍රාමික ලිපිගොනුව, විශ්‍රාමික ලිපිගොනුව හා මධ්‍යගත දත්ත පද්ධතිය අතර සම්බන්ධතාවය තහවුරු කර මාසික විශ්‍රාම වැටුප් ගෙවීම්වල නිවැරදිතාවය තහවුරු කර ගැනීමට කටයුතු කර නොතිබුණි.
- නව විශ්‍රාම වැටුප් දත්ත පද්ධතියේ, 2008 වර්ෂයේ සිට දත්ත ඇතුළත් වන නමුත් දත්ත නොමැති කාලපරිච්ජේදයන් ද පැවතුණි.
- විශ්‍රාම වැටුප් ගෙවීම්වලට අදාළ වූ දත්තයක්, දත්ත පද්ධතියට ඇතුළත් කළ පසු, එම දත්තයන්, මාණ්ඩලික නිලධාරියකු විසින් වලංගු කිරීමක් (data validation) සිදු නොකිරීම හා දත්ත පද්ධතිය තුළ මාණ්ඩලික නිලධාරියකු සඳහා වලංගු කළ හැකි උපරිම ගෙවීම් සීමා තීරණය කර නොතිබුණි.

- මධ්‍යගත දත්ත පද්ධතිය තුළ 2015 දෙසැම්බර් මාසය අවසානය වන විට විශ්‍රාමිකයින් 90,000 ක් සඳහා ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කර නොතිබුණි.

- විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මඟින් විශ්‍රාම වැටුප් අංක නිකුත් කිරීම ආරම්භ කළ පසුව සිවිල් විශ්‍රාම වැටුප් අංක 1,100,000 කාණ්ඩයෙන් ඉහළ අංක නිකුත් කිරීම පරීක්ෂාවේදී විශ්‍රාමිකයින් දෙදෙනකු සඳහා එකම විශ්‍රාම වැටුප් අංකය ලබාදී තිබුණු අවස්ථා 678 ක් විය. එසේම එකම විශ්‍රාම වැටුප් අංකය විශ්‍රාමිකයින් තිදෙනෙකුට ලබාදී තිබුණු අවස්ථාවක් නිරීක්ෂණය විය.

- තොරතුරුවල ඌණතාවයන් දත්ත පද්ධතිය තුළ පවතින බැවින් දත්ත පද්ධතියට පාලන පද්ධතීන් ස්ථාපිත කළ නොහැකි වී තිබුණි.

- විමධ්‍යගතව හා මධ්‍යගතව විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා පාලන ගිණුමක් භාවිතා කර නොතිබුණි.

- පරිගණක උපදේශක සේවා විධිමත්ව ලබා නොගැනීම නිසා පහත සඳහන් අඩුපාඩු සිදු වී තිබුණි.

- විශ්‍රාම ප්‍රතිලාභ සැලසීම අඛණ්ඩව සිදු කිරීම සඳහා අවශ්‍ය වන පරිගණක වැඩසටහන් උපදේශක සේවාව ලබා ගැනීම සඳහා දෙපාර්තමේන්තුව විසින් තිරසාර වූ ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. ඒ අනුව රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගත් පුද්ගලයකුගෙන් එම සේවාව ලබා ගැනීමට කටයුතු කර තිබුණි.

- උක්ත සේවාව ලබා ගැනීම සඳහා උපදේශක හා දෙපාර්තමේන්තුව අතර සේවා ගිවිසුමක් 2012 ජනවාරි 05 දින අත්සන් කර තිබුණද, එම ගිවිසුම වලංගු කාලසීමාවක් සඳහන් කර නොතිබුණි.

- විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීමේ කටයුතු තනි පුද්ගලයකු විසින් සපයනු ලබන තොරතුරු තාක්ෂණ උපදේශණ සේවාව මත රඳාපවතින අවස්ථාවක නොවැලැක්විය හැකි හේතූන් මත එම සේවාව සැපයීම අඩාල වුවහොත් දෙපාර්තමේන්තුව විසින් සලසන සේවාවන් සඳහා බාධා ඇතිවීමට ඉඩ තිබුණි.

- තොරතුරු තාක්ෂණ උපදේශක, මෘදුකාංග සැකැසීම හා විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධ දත්ත පද්ධතියේ කාර්යයන්හිද නියැලෙන බැවින් විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රියාදාමය අභ්‍යන්තර පරීක්ෂණයකින් තොරව ක්‍රියාත්මක කර තිබුණි .

(ඇ) **මහ බැංකුවේ රඳවා ගෙන තිබුණු දායකත්ව විශ්‍රාම වැටුප් දායක හා පොලිය**

---

2002 වර්ෂයේ සිට 2005 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අදාළව දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමය යටතේ අයකර මහ බැංකුවේ රඳවාගෙන තිබුණු රු.මිලියන 1,127.13 ක හා ඊට අදාළ පොලිය 2016 සැප්තැම්බර් 30 දින වන විටත් දෙපාර්තමේන්තුව වෙත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3.17 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 24 | 20 | 04 | - |
| (ii) | තෘතියික මට්ටම | 11 | - | 11 | - |
| (iii) | ද්විතියික මට්ටම | 1,076 | 901 | 175 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 75 | 52 | 23 | - |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | - | 11 | - | 11 |
| | එකතුව | 1,186 | 984 | 213 | 11 |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

(i) 2014 හා 2015 වර්ෂවල සිට සිදු කරන විශ්‍රාම වැටුප් ගෙවීම් ප්‍රතිව්‍යුහකරණය යටතේ වෙනස් වූ සංවිධාන ව්‍යුහයට අනුව අවශ්‍ය කාර්ය මණ්ඩලය නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි.

### (ආ) වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්

දෙපාර්තමේන්තුව විසින් වෙනත් පර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| සේවක වර්ගය | සංඛ්‍යාව | වෙනත් පාර්ශවය | කාලපරිච්ඡේදය |
|---|---|---|---|
| කාන්තා පොලිස් සැරයන් | 01 | ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව | 2010.06.08 සිට |
| කාන්තා පොලිස් කොස්තාපල් | 01 | ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව | 2012.02.24 සිට |
| කාන්තා පොලිස් කොස්තාපල් | 03 | ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව | 2015.06.25 සිට |